ආරම්භය : 1945-09-30 ලි.ප. අංකය : කො 39/482
ධර්ම දානය පිණිස සෑම පුර පසලොස්වක් පොහෝ දිනයක් පාසා නිකුත් කරන
දෙහිවල බෞද්ධෝදය සංගමයේ මාසික ධර්ම පත්‍රිකාව

බෞද්ධෝදය



68 වර්ෂය - ශ්‍රී. බු. ව. 2557 | 2013 දෙසැම්බර් 16 | උඳුවප් කලාපය

808 මාසික ධර්ම පත්‍රිකාව

# සතරාකාර පුද්ගලයෝ !

ගල්කිස්ස ශ්‍රී ධර්මපාලාරාමය සහ කතරගම උපාලි ධර්මාශ්‍රමාධිපති
ශ්‍රී සුමංගල විද්‍යාවතංස - මහා මහෝපාධ්‍යාය
අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය කොටුගොඩ ධම්මාවාස අනුනායක
ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස**

**" චත්තාරෝ මේ භික්ඛවේ පුග්ගලා සන්තෝ, සංවිජ්ජමානා ලෝකස්මිං, කතමේ චත්තාරෝ ? උග්ඝටිතඤ්ඤු - විපචිතඤ්ඤු - නෙය්‍යො - පදපරමෝ ! ඉමේ ඛෝ භික්ඛවේ චත්තාරෝ පුග්ගලා සන්තෝ සංවිජ්ජමානා ලොකස්මින්ති. "**

මහණෙනි, මේ ලෝකයෙහි පුද්ගලයෝ සතර දෙනෙක් වෙති, උග්ඝටිතඤ්ඤ පුද්ගලයා යනු කී විගස ම ඇසූ විගස ම - දුටු විගස ම එය තේරුම් ගතහැකි බුද්ධිමතා ය. දෙවැන්නා විපචිතඤ්ඤු පුද්ගලයා ය. ඔහුට විස්තර සහිතව - යමක් අසා කියා දැක අවබෝධ කරගැනීමේ ශක්තිය - හැකියාව - උපතින් ම පිහිටා ඇත. නෙය්‍ය පුද්ගලයා නම් කලක් වෙහෙස මහන්සි වී දැඩි උත්සාහයක් දරා අවශ්‍ය දෙය දැකීමෙන් ඇසීමෙන් සහ පළපුරුද්දෙන් අවබෝධ කරගන්නා පුද්ගලයා ය, සතර වැනි පුද්ගලයා පදපරම ගණයට වැටෙයි. පදපරම පුද්ගලයාට කෙතරම් ඇසුවත්, කෙතරම් දුටුවත්, කෙතරම් කාලයක් පරිචය කළත් අවශ්‍ය විෂයය - කාරණය තේරුම් ගැනීමට ශක්තියක් නැත. මේ ලෝකයෙහි වෙසෙන අපසැම කෙනෙක්ම මේ සතරාකාර ක්‍රමයෙන් එක කොටසකට වැටේ, අංගුත්තර නිකායෙහි සඳහන් වන මේ කරුණු සතරෙන් අද ධර්ම පත්‍රිකාවෙන් පැහැදිලි කරනු ලබන්නේ පළමු වැනි තැනට වැටෙන පුද්ගලයා ගැන ය. එනම් උග්ඝටිතඤ්ඤු පුද්ගලයා ගැන ය. හෙතෙමේ උපතින් ම ගෙනෙන ලද ප්‍රඥාව ඇති කෙනෙකි. සහජයෙන් ම නැණවතෙකි. ඒ භික්ෂූන් වහන්සේට ඔහුට හෝ ඇයට බුදුරජාණන් වහන්සේ හෝ ශ්‍රාවක නමක් -

අදහසක් පැහැදිලිව දක්වන විට ම සැණෙකින් අවබෝධ වන්නේ ය. බණට දහමට පමණක් නොව ශිල්ප ශාස්ත්‍ර ඉගෙන ගන්නා දරුවනට ද ගොවිතැන් කර්මාන්තය සඳහා යෙදෙන බාල තරුණ අයට ද ඒ දෙය පැහැදිලිව කියා දෙන විට, එය දකින විට හා කරන විට මනා ලෙස පැහැදිලි වන්නේ ය.

බුදුරදුන් දවස උන්වහන්සේ වදාරණ කරුණු සැණෙකින් අවබෝධ කරගත් පින්වත් පුද්ගලයෝ සිටි බව පොත පතින් පැහැදිලිව පෙනෙන්නේ ය. ඉගෙන කියා ගන්නා දරුවන් අතර ද ගුරුවරයා හෝ මවුපිය වැඩිහිටි කෙනෙක් කාරණයක් පහදා දී ලියා කියා දෙන විට ම වටහා ගැනීමේ ශක්තියක් පුණ්‍ය බලයක් ඇති දරුවෝ දැනුදු අප අතර සිටිති. එසේම ගොවිතැන් කර්මාන්තාදිය පිළිබඳව ද කළ දෙයක් දුටු විගස ම ඒ පිළිබඳව තම සිත් සතන් යොමු කොට වටහා ගැනීමෙහි ශක්තිය ඇත්තෝ අප අතර නැත්තේ නොවේ, එම පුද්ගලයන් සතර දෙනා අතුරෙන් මෙම ධර්ම පත්‍රිකාවෙන් උග්ඝටිතඤ්ඤු පුද්ගලයා ගැන පමණක් දක්වනු ලැබේ. විපඤ්චිතඤ්ඤු නෙය්‍ය පදපරම යන පුද්ගලයන් ගැන ඉදිරි ධර්ම පත්‍රිකාවල දී එකින් එක විස්තර කෙරෙනු ඇත.

පොදුවේ ගත් කල උග්ගටිතඤ්ඤු පුද්ගලයා වාසනාවන්ත කෙනෙකි. ධර්මානුකූල වචනයකින් කියතහොත් ඔහු හෝ ඇය ත්‍රිහේතුක ප්‍රතිසන්ධියකින් උපත ලද කෙනෙක් බව ඉඳුරා ම කිවහැකිව තිබේ. ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය යනු මෙලොව උපත ලැබීමට පෙර ආත්මභාවයෙන් චුත වන මොහොතේ දී ඒ ආත්මයේ දී හෝ පෙර ආත්මභවයක දී හෝ සිදුකරගත් අලෝභ - අදෝස - අමෝහමය කුසලයක් සිහිපත් වීම ය. “ භවතෝ භවස්ස පටිසන්ධානං පටිසන්ධි” යනුවෙන් විග්‍රහකොට ඇති පරිදි අතීත භවයෙන් චුතවීමත් සමග ම මේ භවයෙහි පිළිසිඳ ගැනීම සිදුවන අවස්ථාවේදීත් ඇති වන චිත්ත මාලාවය, ලෝභයෙන් නොබැඳී - ද්වේෂයෙන් නොකිළිටිව මොහයෙන් මුළා නොවී තමා කරගත් පිනක් සිහිපත් වූ විට ඵලඟ උපත ත්‍රිහේතුක ප්‍රතිසන්ධියකින් ම සිදු වේ. කෙනෙක් තම ජීවිත කාලය තුළදී ලාභ ප්‍රයෝජන කීර්ති ප්‍රශංසා තනතුරු ආදියක් පිළිබඳව කිසිදු බලාපොරොත්තුවක් නොමැතිව වටිනා දානාදී කුෂලක්‍රියාවක් කරයි. නැත්නම් පාසලක් වෙහෙරක් විහාරයක් වැඩිහිටි නිවාසයක් හෝ ජනතාවට ප්‍රයෝජනවත් පරිත්‍යාගමය කුසලයක් සිදුකරයි. එහි කිසිදු අමතර බලාපොරොත්තුවක් නැති විය යුතුය. දෙවැනි කාරණය අන් අය සිදු කරන පින්කම් වලට වඩා ඉහළින් කැපී පෙනෙන අයුරින් හෝ අන් අයට පෙනෙන පරිදි උජාරුවට - ඊර්ෂ්‍යයා ක්‍රෝධාදියෙන් මුසුව කරන ලද පින් කමක් නොවිය යුතු ය. අන් අය කරන පින්කම් වලට වඩා තමන්ගේ පින්කම ඉස්මතු වන පරිදි ද්වේෂයෙන් නො කරන්නක් විය යුතු ය. අමෝහ යනුවෙන් කියවෙන්නේ පිනේ ඇති වටිනාකම පිළිබඳව අවබෝධයක් නො මැතිව - කරන්නන්වාලේ කරන පින්කමක් නොව - එහි ඇති වටිනාකම තේරුම් ගෙනම කුසලක්‍රියාවක් කිරීම ය. මෙසේ ලෝභයෙන් කිළිටු නොවූ, ද්වේෂයෙන් අපිරිසිඳු නොවූ, මෝහයෙන් යුක්ත නොවූ පින්කමක් සිහිපත් වූ විට ඒ අනුව ඵලඟ උපත සිදුවන්නේ ත්‍රිහේතුක ප්‍රතිසන්ධියකිනි.

උග්ඝටිතඤ්ඤු පුද්ගලයන් පිළිබඳව සඳහන් කරන විට බාහිය දාරුචීරිය - සන්තති ආදි භවතුන් ගැන කරුණු කීමට ඇත. එහෙත් මෙහිදී බාහිය දාරුචීරිය රහතන් වහන්සේ පිළිබඳව සැකෙවින් කරුණු දක්වනු ලබන්නේ උග්ඝටිතඤ්ඤු පුද්ගලයා පිළිබඳ විස්තර දැනගැනීමේ පහසුව සඳහා ය. ගෞතම බුදුරදුන් දවස වහා ලබන ලද අභිඥා ඇති එනම් සැණෙකින් රහත් බවට පත් භික්ෂූන් වහන්සේලා පිළිබඳව කරුණු කියන විට බාහිය දාරුචීරිය තෙරුන්ගේ කතා පුවතින් පැහැදිලි කළ හැකි ය. මුන්වහන්සේ බුදුරදුන් වදාල බණපද කිහිපයක් අසා මහරහත් බවට පත්වූහ. එනිසා ම " **ඒතදග්ගං භික්ඛවේ මම සාවකානං භික්ඛුනං ඛිප්පාභිඤ්ඤානං යදිදං බාහියෝ දාරුචීරියෝ**" යනුවෙන් අසූමහා ශ්‍රාවකයාණන් වහන්සේලා අතර අග්‍රස්ථානය ද ලබාගෙන ඇත.

මේ බාහිය නැමැත්තා තොග වෙළඳ ව්‍යාපාරිකයෙකි. වෙළඳාම පිණිස ස්වර්ණභූමියට (බුරුම රටට) මුහුදෙන් බඩු රැගෙන පිරිසක් සමග නැව් මගින් යන අතර සුළි සුළඟකට හසුවී කුඩා සුලුප්පු ( නැව් ) සමූහය කැඩී බිඳී සුනු විසුනු විය. පිරිස ද මුහුදුබත් වූහ. නැවකින් කැඩුණු ලෑල්ලක් අල්ලාගෙන පිහිනන්නට පටන් ගත් බාහිය දිවි බේරාගෙන කුඩා දූපතකට ගොඩවී ය. නිර්වස්ත්‍රව සිටි මෙතෙමේ විලකට බැස දියමත හැදෙන දියසෙවෙල් ශරීරයේ පටලවාගෙන එමගින් විලි වසාගෙන අහුලාගත් මැටිමුට්ටියක් ද අතැතිව කෑම ටිකක් සොයා ගැනීමට කුඩා ගෙවල් මණ්ඩියකට ගියේ ය. මෙය දුටු මිනිස්සු මෙතෙමේ තවුසෙක් යයි සලකා අර මුට්ටියට තමන් කන බොන ආහාර පාන ටික ටික බෙදුහ. මෙයින් ම දින පතා ඔහු ජීවිතය රැකගති. අතරමංව කරකියා ගතහැකි දෙයක් නොමැතිව සිටි ඔහු දියසෙවෙල් ඉවත් කොට කොළ සහ වියලි පරඬැල් ඉන වට ඔතාගෙන කෙස්වැටිය හිසමත බැඳගෙන වැඩුනු රැවුලක් සහිතව කට කැඩූ මුට්ටිය පාත්‍රයක් සේ සකසා ගෙන දිනපතා පිඩු පිණිස යයි. ටික දවසකින් මිනිසුන් කතාකරන භාෂාවේ වචන ගණනාවක් ද මතක තියාගෙන ඒ වචන භාවිත කරමින් මම රහත් නමක් වෙමියි " මිනිසුන්ට හඟවන්නට - කියන්නට පටන්ගති, වඩාත් පැහැදීමට පත් මිනිස්සු පිණ්ඩපාතයෙන් ඔහුට සංග්‍රහ කළහ.

බාහිය දාරුචීරිය සමග කාශ්‍යප බුද්ධ කාලයෙහි එකට මහණදම් පිරූ අනාගාමී බවට පත් භික්ෂු නමක් බඹලොව බ්‍රහ්මරාජයෙක්ව පහළව සිටියේ ය. හෙතෙමේ තම මිත්‍රයා දැන් අතරමංව " යාචක බව සඟවාගෙන මම රහතෙක් වෙමියි කිය කියා දුගී මිනිසුන්ගෙන් ලැබුණු දෙයක් වළඳමින් ජීවත්වෙයි. මොහුට පින් ඇත. රහත්වීමට හැකි ය. ගෞතම බුදුරදුන් ලොව පහළව ජේතවනාරාමයේ වෙසෙන බව මොහුට දන්වා එහි යැවිය යුතු යැයි " සිතා මේ බ්‍රහ්ම රාජයා සැණෙකින් බාහිය දාරුචීරිය ඉදිරියේ සිහිනෙන් පෙනී සිට ඔහුට මෙසේ කීවේ ය. " බාහිය දාරුචීරිය, ඔබ රහතෙක් නොවේ, රහත් බවට අවශ්‍ය ගුණයන් ඔබ ළඟ නැත. ඔබත් මමත් තව දෙතුන් නමකුත් කාශ්‍යප බුද්ධ කාලයෙහි මහණදම් පිරුවෝ වෙමු. ගෞතම බුදුරදුන් දැන් ලොව පහළව ඇත. සැවැත්නුවර වෙසෙති, වහා දැන්මම නිදිගැට හැරදමා උන්වහන්සේ වෙත යන්න,-

උන්වහන්සේ වෙතින් ඔබට මොක් මග වහා ලබාගත හැකි යයි කියා බ්‍රහ්මයා අතුරුදන් විය. ගෞතම බුදුරදුන් පහළවී ඇති බව ඇසූ බාහියට අසීමිත සතුටක් ඇතිවි ය. බාහිය තවුසා වහා නැගිට්ටේ ය. ඒ මහරෑම සැවැත් නුවරට යන්න මගට බැස්සේ ය. බුද්ධ යන වචනය ඇසීමෙන් ඔහු තුල ඇති වූයේ අපරිමිත ප්‍රබෝධයකි. පසුදා පෙරවරුවෙහි අවසාන භාගය පමණ වන විට එනම් පසුදා දාවල දහයාමාර - එකොළහ පමණ වන විට බාහිය තවුසා ජේතවනයට පැමිණියේ ය. බුදුරදුන් නැත, විමසුවේ ය. උන්වහන්සේ පිඬු පිණිස වැඩමකළ බව අසා වහා පිණ්ඩපාතයේ වඩින බුදුරදුන් වෙත මහ මගට දිව ගොස් වැඳ වැටී භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේ ලොව පහළවූ බව ඇසීමෙන් මට ඇතිවූයේ අපරිමිත සතුටකි. අනේ ! ස්වාමිනී මට බණ පදයක් පවසනු මැනවි, බොහෝ දුරක සිට ඊයේ රාත්‍රී පටන් මම නොඉවසිල්ලෙන් ඔබ වහන්සේ දැකීමට පැමිණියෙමි.

තුන්වන වරටත් ඉල්ලීමක් කළ විට ඉවතලීමට නොහැකි වූ බුදු පියාණෝ බ්‍රහ්ම රාජයා සිහිනෙන් කී පරිදි ම ඔහුගේ පෙර පින බලා " **තස්මාහිතේ බාහිය දාරුචිරිය, එවං සික්ඛි තබ්බං දිට්ඨේ දිට්ඨමත්තං භවිස්සති, සුතේ සුතමත්තං භවිස්සත, මුතේ මුත මත්තං භවිස්සති, විඤ්ඤාතේ විඤ්ඤානතමත්තං භවිස්සති** " යන බණපද හතර කියා නිමවෙත් ම කොළ පරඬැල් වැහැරියකින් විලි වසා සිටි බාහිය දාරුචිරිය සවි කෙලෙසුන් නසා උතුම් වූ රහත් භාවයට පත්වූයේ ය. කාශ්‍යප බුදුරජාණන් වහන්සේ දවස ඔහු මහණදම් පිරීමේ උතුම් ගුණ බලය මේ භවයේ දී රහත් වීම පිණිස පිහිට වූ ආකාරය මෙයින් පැහැදිලි වන්නේ ය. උග්ඝටිතඤ්ඤු පුද්ගලයෝ මෙසේ සැණෙකින් ධර්මය අවබෝධ කරගත හැකි පුණ්‍ය බලයකින් යුතු උතුමන් බව සැලකිය යුතු ය. උන් වහන්සේට රහත් වීම සඳහා අමුතු වෑයමක් දරන්නට නො සිදුවූයේ - පෙර නිසි පරිදි මහණදම් පිරීමේ පුණ්‍ය බලය නිසා ය.